# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/26 - 2014 අගෝස්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2014.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත

1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම් කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ 3 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 10 වැනි වගන්තිය යටතේ මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍ය.

2014 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝගය 2014 නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට (බලපත්‍ර ලබාදීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙහි සඳහන් දින සිට බලාත්මක විය යුතුය.

2. නැව් බඩු ගෙනයාමේ ව්‍යාපාරය හෝ යාත්‍රා කියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන සෑම සමාගමක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තත් කාර්යය සඳහා බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

3. බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක ම ඒ ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන සියලු තොරතුරු අඩංගු විය යුතු අතර, එම ඉල්ලීම සමඟ අදාළ ගාස්තුව ද ඉදිරිපත් කළ යුතු ය.

4. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදු වුවහොත්, ඒ පිළිබඳව ප්‍රමාදයකින් තොරව ඉල්ලුම්කාර සමාගම විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට තොරතුරු ලබාදෙන බවට ලිඛිත ප්‍රකාශයක් ද බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් සමගම ඉදිරිපත් කළ යුතු ය.

1A - G 20322— 05 (2014/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සහ ලියාපදිංචි කළ හෝ නැවත ලියාපදිංචි කළ රාජ්‍ය හෝ පෞද්ගලික සීමිත වගකීම් සහිත සමාගමක් නොවන සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන සහ ඡන්ද බලය සහිත නිකුත් කළ කොටස් ප්‍රමාණයෙන් 60%කට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් දරනු නොලබන කිසිදු සමාගමක්, නැව් බඩු ගෙනයාමේ ව්‍යාපාරය හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් ලබාගැනීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

6. ඉහත 5 වැනි නියෝගයේ විධිවිධාන කවරක් වුව ද එය නොසලකා එහි සඳහන් ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට පහත සඳහන් සමාගම් හිමිකම් ලබනු ඇත.

(අ) අංක 1232/14 හා 2002 අප්‍රේල් 19 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කළ විනිමය පාලන දැන්වීම ප්‍රකාර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙතින් මේ වන විටත් වඩා වැඩි විදේශ අයෝජන ප්‍රතිශතයක් සඳහා අනුමැතිය ලබා ඇති සහ එකී ප්‍රතිශතය දක්වා පමණක් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් දරනු ලබන සමාගම්;

(ආ) 2013 අංක 12 දරන මූල්‍ය පනත මගින් සංශෝධිත 2012 අංක 12 දරන මූල්‍ය පනතේ IV වැනි කොටස යටතේ සාදන ලද 2013 අංක 1 දරන මූල්‍ය පනත/වාණිජ මධ්‍යස්ථාන නියෝග ප්‍රකාර ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර ඇති සමාගම්;

(ඇ) අංක 1232/14 හා 2002 අප්‍රේල් 19 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කළ විනිමය පාලන නිවේදනය ප්‍රකාර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙතින් ඉහළ ප්‍රතිශතයක විදේශ ආයෝජන සඳහා අනුමැතිය ලබා ඇති මෙම නියෝග පළ කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර ප්‍රේෂණ වශයෙන් සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා අවම වශයෙන් එ. ජ. ඩොලර් මිලියන 10ක ආයෝජන ලබා ඇති එම සමාගමේ ඡන්ද බලය සහිත නිකුත් කළ කොටස් ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 20%ක් ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් දරනු ලබන සමාගම්.

7. ඉහත 5 හා 6 වගන්තිවල සඳහන් කවර හෝ සමාගමක කොටස් අයිතිය දරන ශ්‍රී ලාංකික පුරවැසියෙකු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන තැනැත්තෙකුගේ නාමෝද්දිෂ්ඨයා, හෝ භාරකරු හෝ නියෝජිත වශයෙන් එකී කොටස් දරනු ලබන්නේ නම්, එකී කොටස් හෝ ඒවායින් යම් කොටසක කොටස් හිමිකරු වශයෙන් ඔහු නොසැලකිය යුතු ය.

එතකුදු වුවත්, අධ්‍යක්ෂ ජනරාල් විසින් එසේ කළ යුතුයයි නියම කරනු ලබන්නේ නම්, එකී කොටස් හිමියන් වෙතින් ඉදිරිපත් කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් මගින් ඒ පිළිබඳව සනාථ කිරීමක් එවැනි සමාගමක් විසින් ඉදිරිපත් කළ යුතු ය.

8. ප්‍රවාහන ලේඛනයක් හෝ ප්‍රේරක නියෝජිත භාණ්ඩ ලදුපතක් හෝ ජාත්‍යන්තර භාණ්ඩ ගෙනයාමේ සේවාවලට සම්බන්ධ පූර්ණ සවිස්තරාත්මක සේවා ඇතුළු වෙනත් සියලු සම්බන්ධිත සේවාවන් සපයනු ලබන නැව් බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයකු වන ඉල්ලුම්කරුවකුට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව "ඒ " පන්තියේ (Class A) බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ජාත්‍යන්තර ප්‍රවාහන සේවා පිළිබඳ අවම වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක් ඇති මාණ්ඩලික නිලධරයකු කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්තව සිටිය යුතු ය.

(ඇ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නැව් බඩු ගෙනයන්නකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතු ය.

(ඈ) ඉල්ලුම්කරු අවම වශයෙන් ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක ($/1,00,000) නැව් බඩු ගෙනයන්නන්ගේ සියලු ආපදා වගකීම් රක්ෂණ ආවරණයක් සහ අවම වශයෙන් ඇමරිකන් ඩොලර් පනස් දහසක ($/50,000) වැරදීම් හා නොකර හැරීම් සඳහා වූ රක්ෂණ ආවරණයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබිය යුතු ය.

(ඉ) අන්තරාදායක නැව් හෝ ගුවන් භාණ්ඩ ඇතුලුව නැව් හෝ ගුවන් භාණ්ඩ පිළිබඳ කටයුතු කිරීමේ වෘත්තීය පුහුණුවක් පිළිගත් ආයතනයකින් සම්පූර්ණ කර ඇති සහ ඒ පිළිබඳ වලංගු සහතිකයක් දරන තැනැත්තන් අවම වශයෙන් දෙදෙනෙක් ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්තව සිටිය යුතු ය.

(ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, වගකීම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් මගින් පිළිගනු ලැබ ඇති හෝ ජාත්‍යන්තර නැව්බඩු ගෙනයන්නන්ගේ සංගමයේ තෞභාරපත්‍ර නිකුත් කිරීම සඳහා පිළිගනු ලැබ ඇති "සම්මත වෙළඳ කොන්දේසිවලට" අනුකූලව ක්‍රියා කළ යුතු ය.

9. තෞභාරපත්‍රය, ගෘහස්ත තෞභාරපත්‍රය, සමුද්‍රික තෞභාර පත්‍රය, ගුවන් තෞභාර පත්‍රය, ගෘහස්ථ ගුවන් තෞභාර පත්‍රය, බහුවිධ ප්‍රවාහන ලේඛනය, ප්‍රේරක නියෝජිත ලදුපත වැනි ජාත්‍යන්තර නැව් බඩු ප්‍රවාහනය සඳහා භාණ්ඩ රැගෙන යාමේ ලේඛන නිකුත් කිරීම හැර, දේශීය වශයෙන් නැව් බඩු ගෙනයාම සහ ප්‍රවාහනයට අදාළ සේවා සැපයීම සිදු කිරීමෙහි නියැලී සිටින ඉල්ලුම්කරුවෙකුට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව බී පන්තියේ (Class B) බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය ඃ

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නැව් බඩු ගෙනයන්නකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතු ය.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, වගකීම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් විසින් පිළිගනු ලැබ ඇති හෝ ජාත්‍යන්තර නැව් බඩු ගෙනයන්නන්ගේ සම්මේලනයේ තෞභාර පත්‍ර නිකුත් කිරීම සඳහා පිළිගනු ලැබ ඇති "සම්මත වෙළඳ කොන්දේසිවලට'' අනුකූලව ක්‍රියා කළ යුතු ය.

10. (1) මේ නියෝග ප්‍රකාරව නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටුවනු ලැබුවහොත් මිස, එම බලපත්‍රය නිකුත් කරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනය දක්වා වලංගුව පැවතිය යුතු ය.

(2) සෑම නැව් බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවෙකු නොවන පොදු ප්‍රවාහකයකු විසින් ම රුපියල් දස දහසක (රු. 10,000) වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

11. (1) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලීමක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් වර්ෂයක් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ඊට පෙර වර්ෂයේ නොවැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

12. නැව් බඩු ගෙනයන්නකුගේ හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකුගේ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රලාභියකු විසින් ම මහජන යහපත උදෙසා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කළ නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

13. මේ නියෝග යටතේ නියම කර ඇති පරිදි ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක හෝ දිවුරුම් පත්‍රයක අන්තර්ගතවූ යම් තොරතුරු හෝ විස්තර වැරදි හෝ අසත්‍ය බවට අනාවරණය කරගනු ලැබුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට හෝ එය අස්කර ගැනීමට හෝ අත්හිටුවීමට හෝ එම සමාගමට ප්‍රදානය කර ඇති යම් වරප්‍රසාදයක් අස්කර ගැනීමට හෝ අත්හිටුවීමට වහාම පියවර ගනු ලැබිය හැකිය.

14. මෙම රෙගුලාසි සඳහා සමාගම යනුවෙන් හඳුන්වන්නේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි පිහිටුවනු ලැබූ ලියාපදිංචි කර ඇති හෝ නැවත ලියාපදිංචි කර ඇති වගකීමෙන් සීමිත පොදු හෝ පුද්ගලික සමාගමකි.

15. 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 10 වැනි වගන්තිය යටතේ 2011 අගෝස්තු 02 වැනි දිනැති අංක 1717/6 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළකළ නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට (බලපත්‍ර ලබා දීමේ) රෙගුලාසි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**උපලේඛනය**

(*2 වැනි සහ 8 වැනි නියෝග*)

**නැව්බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීම.**

1. ඉල්ලුම්කරුගේ නම :................................................................................................................................
2. ලියාපදිංචි ලිපිනය :...............................................................................................................................
3. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද අංකය සහ දිනය :....................................
   (i) සමාගමේ ලියාපදිංචි අංකය :.......................................................................................................
   (ii) සංස්ථාගත කළ දිනය :...................................................................................................................
4. ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය :.....................................................................................................
5. දුරකථන අංකය : ...................................................................ෆැක්ස් අංකය :..................................................
   ඊමේල් ලිපිනය :.......................................................................................................................................
6. පුද්ගලික සමාගමක් ද නැතහොත් පොදු සමාගමක් ද යන්න සඳහන් කරන්න :...........................................
7. සමාගමේ ගෙවා නිම කළ ප්‍රාග්ධනය :........................................................................................................
8. සමාගමේ යම් විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :...............................................
9. බැංකු ඇපකරය පිළිබඳ විස්තර :...................................................................................................................
10. ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි වී ඇති අංකය :..........................
11. සියලු ආපදා වගකීම් රක්ෂණ ආවරණය පිළිබඳ විස්තර :.............................................................................
12. 5 වැනි නියෝගයේ (ආ) ඡේදයේ සඳහන් කර ඇති මාණ්ඩලික නිලධාරියාගේ නම සහ ජාත්‍යන්තර ප්‍රවාහන සේවා ක්ෂේත්‍රය පිළිබඳව ඔහුට ඇති පළපුරුද්ද :..........................................................................................
13. කලින් පැවති බලපත්‍රය පිළිබඳ විස්තර (අදාළ වන්නේ නම්) වර්ෂය :..............................................................
14. ඉල්ලුම්කාර නැව්බඩු ගෙනයන්නා/යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයා විසින් පසුගිය වර්ෂ තුන ඇතුළත ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන ලද නැව් බඩුවල ප්‍රමාණය (එක් එක් වර්ෂය සඳහා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් දක්වන්න) :.....................................................................................................................

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදු වුවහොත් සහ සමාගම ඇමතීමට ලබා දී ඇති විස්තරවල වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීමට අප එකඟ වෙමු.

මේ බලපත්‍රය මඟින් අවාරණය වී ඇති කටයුතුවලට අදාළ ලිඛිත නීතියට අදාළ විධිවිධාන පිළිබඳව අප හොඳින් දන්නා බව ස්ථිර ලෙස ප්‍රකාශ කරමු.

1972 අංක 10 දරන නැව්බඩු නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අධිකාරිය යටතේ හැර නැව්බඩු ගෙනයන්නකු හෝ කන්ටේනර් මෙහෙයුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට උද්දේශිතව අප විසින් යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට, පුද්ගලයකුට හෝ සංස්ථාවකට යම් සේවාවක් සැලසීම කරනු නොලබන බවට මෙයින් ප්‍රකාශ කරමු.

අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව මෙම ඉල්ලීමේ අන්තර්ගත සියලු ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවට අපි ප්‍රකාශ කරමු.

....................................................,
අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරුන්ගේ නම/නම් සහ අත්සන/අත්සන්.

දිනය :................................................

සැ. යු. - සියලු අදාළ සහතිකවල/ප්‍රකාශවල සහතික පිටපත් අමුණා ඇත.

10-496

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.